www.wsws.org **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් පාලනාධිකාරය ඉරානයට එරෙහි යුද්ධයට සැරසෙයි

## *පලමු කොටස*

**The Bush administration prepares for war against Iran -- Part 1**

**පීටර් සීමන්ඩ්ස් විසිනි**
**2007 පෙබරවාරි 16**

*ජනවාරි 25 සිට 27 දින දක්වා පැවති ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජික රැස්වීමට පීටර් සිමන්ඩ්ස් විසින් ඉදිරිපත් කල වාර්තාවේ පලමු කොටස පහත පලකෙරේ. ඔහු සමාජවාදී සමානතා පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙක් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සාමාජිකයෙකි.*

ජනවාරි 10 වැනි දින එක්සත් ජනපද ජනාධිපති බුෂ් පැවැත්වූ කතාව, ඉරාක ලේ ස්නානය තීව්‍ර කරමින් හමුදා බලඇනිය 20,000කින් තර කිරීම නිවේදනය කිරීමට වඩා වැඩි දෙයකි. එය සංඥා කලේ, මුලු මැදපෙරදිගම එක්සත් ජනපද ආධිපත්‍යය යටතේ යලි සැකසීමේ බුෂ් පාලනයේ උත්සාහය, තවත් ඉහල නැංවීමකි. මෙම මූලෝපායේ ප්‍රධාන ඉලක්කය ඉරානයයි.

"ඉරාකය තුල ජයග්‍රහනය අත් කර ගැනීම සඳහා එහි භෞමික අඛන්ඩතාව ආරක්ෂා කිරීමත්, අන්තවාදීන්ගේ අභියෝග හමුවේ කලාපයේ ස්ථාවරත්වයත් අවශ්‍ය" බව බුෂ් කියා සිටියි. "මෙය ආරම්භ වන්නේ ඉරානය සහ සිරියාව සමග ප්‍රශ්නය විසඳාගැනීමෙනි". "ඉරාකයේ භෞමික අඛන්ඩතාවය ආරක්ෂා කිරීම" යනු නිසැකව ම ඉරාකයේ සාපරාධී එක්සත් ජනපද මිලිටරි ග්‍රහනය ආරක්ෂා කිරීම වන අතර "කලාපය ස්ථාවර කිරීම" යනු මැද පෙරදිග තුල එක්සත් ජනපද ආධිපත්‍යය ව්‍යාප්ත කිරීම යි.

එක්සත් ජනපද මිලිටරිය "ඉරානයෙන් හා සිරියාවෙන් ගලා එන ආධාර" නතර කල යුතු අතර පුහුනු කිරීම් හා ආයුධ සැපයුම් ජාලයන් "සොයා විනාශ කල" යුතු යයි බුෂ් කියාසිටියේ ය. බුෂ්ගේ කතාව අවසන් ව පැය කිහිපයක් තුල ඇමරිකානු හමුදා දකුනු ඉරාක නගරයක් වන ඉර්බිල්හි ඉරාන තානාපති කාර්යාලයකට හිමිදිරියේ ම කඩා වැදුනහ. මෙහෙයුම සිදු වූයේ දෙසැම්බර් 20 දින බැග්ඩෑඩ්හි දී අක්තපත්‍ර ලැබූ තානාපති නිලධාරින් දෙදෙනෙකු ද අවම වසයෙන් ඉරාන ජාතිකයන් පස් දෙනෙකු එලෙස ම ප්‍රකෝපකාරී ලෙස අත්අඩංගුවට ගැනීමෙන් පසුව ය.

තෙහෙරානය මෙයට දැඩි ලෙස විරෝධය පලකල අතර ප්‍රවේසම් සහගතව, ඉරාක නිලධාරින් ප්‍රකාශ කලේ ඉරානීයන් ඉරාකය තුල රැඳී සිටියේ බැග්ඩෑඩයේ ආරාධනය පරිදි බව ය. මේ සියල්ල ඉවත ලූ එක්සත් ජනපදය බලධාරින් කිසිදු සාක්ෂ්‍යයක් නොමැතිව දිගටම කියා සිටියේ, ඉරානීයන් එක්සත් ජනපද විරෝධී සන්නද්ධ කන්ඩායම්වලට ආධාර කර ඇති බවයි. ඉරානය තුල වොෂිංටනයේ කිට්ටුවන්තයින් ද ඇතුලු සියල්ලන්ට මින් ලැබෙන්නේ, ඉරාකයේ සිදුවන දේ තීරනය කරන්නේ ධවල මන්දිරය හා පෙන්ටගනය විසින් ය යන පනිවිඩයයි.

"අප ඉරාකයේ ආරක්ෂාව තර කිරීමේ මෙන් ම, මැද පෙරදිග ඇමරිකානු අව්‍යතාවන් ආරක්ෂා කිරීමේ පියවරයන් ගන්නෙමු." යයි බුෂ් සිය කතාවේ දී නිවේදනය කලේ ය. මෙම පියවරයන්ට, 2003 ඉරාක ආක්‍රමනයට පසු ප්‍රථමවතාවට ගල්ෆ් කලාපය වෙත දෙවැනි ප්‍රහාරක යුද නෞකාව පිටත් කිරීමත්, ගල්ෆ් රටවල මිසයිල නාශක පේට්‍රියට් මිසයිල පද්ධතීන් ස්ථානගත කිරීමත් ඇතුලත් ය. දැනට ම යූඑස්එස් ජෝන් සී. ස්ටෙනිස් නෞකාව වොෂිංටනයේ බ්‍රෙමර්ටන් වරායෙන් පිටත්ව ගොස් ඇති අතර සති කිහිපයක් තුල තවත් යුද නැව් හතක් හා ගුවන් හමුදා ඒකක නමයක් පර්සියන් ගල්ෆ් කලාපයට යවනු ඇත.

මෙම ස්ථානගත කිරීමේ අරමුන ඉරානයට තර්ජනය කිරීම බව බුෂ් පරිපාලන නිලධාරින් විවෘතව ම ප්‍රකාශ කරති. මෑතක දී පත්කල ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස්, කොන්ඩලීසා රයිස් සමග එක්ව කලාපයේ දිගට හරහට සංචාරය කරමින් බුෂ්ගේ යුද ව්‍යාප්තියට සහාය ගොනු කරන අතර, කාබුල් හි දී ප්‍රකාශ කලේ " ඉරානීයන් පැහැදිලිව විශ්වාස කරන්නේ අප ඉරාකයෙහි සිරවී සිටින බැවින් මූලිකත්වය ඔවුන්ට හිමි වී ඇති බවත් සෑම පැත්තකින්ම අපට බලපෑම් කල හැකි තත්වයක තමන් සිටින බවත් ය. කලාපය වෙත සරලව ම අප දන්වා සිටීමට උත්සාහ කරන්නේ තවත් දිගුකලක් අප එහි රැඳී සිටින බවයි."

ජනවාරි 23 දින ඩුබායි හි දී, රුස්ව සිටියවුන් අමතා රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් වන නිකලස් බර්න්ස් එක එල්ලේ කියා සිටියේ "මැදපෙරදිග ඉරානය විසින් ආධිපත්‍යය දැරිය යුතු කලාපයක් නොවේ. එක්සත් ජනපදය කලාපය තුල යුද නෞකා සේනාංක දෙකක් රඳවා ඇති බව අපට දක්නට ලැබෙන්නේ එබැවිනි. ඉරානය අප සමග ගැටුමකට මාන බලන්නේ නම්, එක්සත් ජනපදය එහි අවශ්‍යතාවන් ආරක්ෂා කරනු ඇති බව ඉරානයට තේරුම් ගැනීමට සිදු වනු ඇත."

"ඉරානය මධ්‍යස්ථ කිරීමේ" නාමයෙන් එක්සත් ජනපදය, ෂියා නිකායික ඉරානයට අභියෝගාත්මකව සෞදි අරාබිය, ජෝර්දානය, ඊජිප්තුව හා ගල්ෆ් රාජ්‍යයන් ඇතුලත්, මැදපෙරදිග "සුන්නි" නිකායික රාජ්‍යයන්හි සන්ධානයක් ගොඩනගමින් සිටියි. මුස්ලිම් ආගමික පාලන තන්ත්‍රයන්ගේ ද ආඥාදායක තන්ත්‍රයන්ගේ ද හවුලකට අන්ධ දමන අතර, මැදපෙරදිග පුරා ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවීම පිලිබඳ මවාපෑම හෙමින් සීරුවේ හැරදැමෙමින් පවතී.

සහාය ගොනු කිරීම සඳහා උප ජනාධිපති ඩික් චේනි ද ඇතුලත් එක්සත් ජනපදයේ ඉහල නිලධාරීන් සෞදි අරාබිය කරා පුරුදු පාරේ රොද බැඳගෙන ගමන් ගනිති. සවුදි රාජාණ්ඩුව සදාම්හුසේන් නෙරපා හැරීමෙන් පසුව සිය සම්ප්‍රදායික පසමිතුරා වන ඉරානයේ අත ශක්තිමත් වී ඇතැයි තැති ගැන්මට පත්ව සිටියි. රයිස්ගේ වචනවලට අනුව "අන්තවාදීන්ට" එරෙහිව "මධ්‍යස්ථධාරින්ගේ සන්ධානයක්" ගොඩ නැගීමට වොෂිංටනය දරන උත්සාහය ඉරාකයේ වත්මන් කන්ඩායම්ක සිවිල් යුද්ධ කලාපය වෙලා ගත් ගැටුමක් බවට පත්වීමේ සැබෑ ම අන්තරායක් ගැබ්කර ගනියි. දෙසැම්බරයේ දී ලන්ඩනයේ පලකෙරෙන සන්ඩේ ටයිම්ස් පත්‍රය අනතුරු ඇඟවූයේ මැදපෙරදිග කන්ඩායම්ක ගැටුම්, 17 වන සියවසේ දී යුරෝපය තුල කතෝලිකයන් හා ප්‍රොතෙස්තානුවන් අතර හටගත් ලේවැකි තිස් අවුරුදු යුද්ධයට සමාන වනු ඇති බවට ය.

පසු ගිය දෙවසර පුරා ඉරානයට පහර දීමේ ඉහල සූදානමක් පෙන්වා දෙමින් පලවූ මාධ්‍ය වාර්තාවලින් හිඟයක් නොවී ය. ප්‍රවීන ජනමාධ්‍යවේදියෙකු වන සෙමෝර් හර්ෂ් විසින් නිව් යෝකර් වෙත සම්පාදනය කල ලිපි මත පදනම්ව *ලෝසවෙඅ* මීට පෙර බොහෝ විස්තරාත්මක ලිපි පලකර තිබේ. 2005 ජනවාරියේ දී පලවූ මුල් ලිපියෙන් වාර්තා කර තිබුනේ, ඉරානය ආක්‍රමනය කිරීමට හා ප්‍රබල ගුවන් ප්‍රහාර එල්ල කිරීම සඳහා පෙන්ටගනය නව යුද සැලසුම් සකසමින් සිටින බවත්, ඉලක්කයන් හඳුනාගැනීම සඳහා එක්සත් ජනපදයේ විශේෂ බලඇනි ඉරානය තුල ක්‍රියාත්මක වන බවත් ය.

ඉරානය සුන්බුන් කල හැකි හොඳම ක්‍රමය පිලිබඳව හමුදා ජෙනරාල්වරු හා නිලධාරීන් වාද කරමින් සිටියදී, ධවල මන්දිරය හා පෙන්ටගනය තුල න්‍යෂ්ටික අවි යොදාගැනීම පිලිබඳව ඉහල පෙලේ සාකච්ඡා පැවති බව පසු ගිය අප්‍රේල් මාසයේ දී හර්ෂ් වාර්තා කලේ ය. ඉරානයට ගුවන් ප්‍රහාර එල්ල කිරීම සඳහා ඊස්රායල මිලිටරියේ සූදානම පිලිබඳව සන්ඩේ ටයිම්ස් පත්‍රය ලිපි මාලාවක් පල කර තිබෙන අතර පසු ගිය මාසයේ උපායික න්‍යෂ්ටික අවි භාවිතා කිරීමට අදාල වාර්තාවක් පලවිය.

කොතෙක් දුරට මෙම සූදානම කෙරීගෙන යන්නේ ද යන්න ඉස්මතු කෙරෙන ප්‍රකාශයන් හිටපු රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරියෙක් වන වේන් වයිට් විසින් රොයිටර් වෙත කර තිබුනි. "ඔබ කතා කරන්නේ තෝරාගත් ගුවන් ප්‍රහාර ගැන නොවේ. ඔබ කතා කරන්නේ ඉරානයට එරෙහි යුද්ධයක් ගැනය. අප කතා කරන්නේ ඉලක්කයන් ගැන මාවතක් සකස් කර ගැනීම පිලිබඳවය"යි ඔහු ප්‍රකාශ කලේ, ඉරාන ගුවන් හමුදාවේ වැඩි කොටසක් හා සබ්මැරීන්, ගල්ෆ් මුහුදේ රඳවා ඇති එක්සත් ජනපද යුද නැව් ඉලක්ක කල හැකි නෞකා නාශක මිසයිල හා ඉරානය සතු බැලිස්ටික් මිසයිල ශක්තිය පවා ඊට ඇතුලත් බවය.

## යුද්ධය සඳහා නිමිත්ත

මිලිටරි සූදානම ද සමග ආන්ඩුවේ නිලධාරීන් මාධ්‍ය තුල ඉරානයට එරෙහිව යුද බෙර හැඬවීම ද සිදුවෙමින් පවතී. ඉරානයට එරෙහිව යුද්ධය සඳහා ගොතන හේතූන් ද ඉරාකයට එරෙහිව ඉදිරිපත් කල දේ මෙන් ම ව්‍යාජ ඒවාය.

- එක්සත් ජනපද නිලධාරීන් විසින් බඩ දඟලවන ආකාරයට පුනරුච්චාරනය කරන, ලැයිස්තුවේ මුලට ම ඇති හේතුව, ඉරානය න්‍යෂ්ටික අවි ගොඩනගමින් සිටින්නේ ය යන්නයි. ඉරාන වැඩ පිලිවෙල ආපසු හැරවිය නොහැකි තැනකට ගමන් කර තිබෙන බවට ඊස්රායලය චෝදනා නගයි. 2003 ඉරාන වැඩ පිලිවෙල තුල කිසිසේත් නොපැවති තරම්, 2007 ඉරාන න්‍යෂ්ටික වැඩ පිලිවෙල ඉදිරියෙන් තිබෙන බව නිසැක ය. එක්සත් ජනපද හා ඊස්රායල තර්ජනය හමුවේ ඉරාන පාලන තන්ත්‍රය බෝම්බයක් සෑදීමට උත්සුක වන්නේ ය යන්න මුලුමනින්ම බැහැර කල නොහැකි ය. නිසැකව ම එහි සමහරෙක් එවන් මූලෝපායක් කැඳවුම් කර තිබේ.

  එහෙත් ජ්‍යෙෂ්ඨ ඉරාන නායකයන් ප්‍රකාශ කර ඇත්තේ රටේ න්‍යෂ්ටික වැඩ පිලිවෙල සාමකාමී කටයුතු සඳහා බවත්, න්‍යෂ්ටික අවි හරන ගිවිසුම යටතේ ඒ සඳහා අයිතිය ඇති බවටත් අවධාරනය කරමිනි. ජාත්‍යන්තර පරමානු බලශක්ති ඒජන්සිය (අයිඒඊඒ) වසර තුනක් කරගෙන ගිය පුලුල්

පරීක්ෂනවලින් පසුව ද රහසිගත න්‍යෂ්ටික වැඩපිලිවෙලක් සොයා ගැනීමට අසමත් වූ අතර අයිඒඊඒ වාර්තාවල ද ඒ පිලිබඳව යලි යලිත් සඳහන් වේ. නටාන්ට්ස් හි යුරේනියම් සුපෝෂන යන්ත්‍රාගාරය හා අරක් හි පිහිටි බැර ජලය (heavy-water) පර්යේෂන ප්‍රතික්‍රියාකාරකය යන, බෝම්බයක් සෑදීමේ දී අත්‍යවශ්‍ය වන ද්‍රව්‍ය විබන්ධ්‍යය සඳහා යොදාගත හැකි අංශ දෙකම නිම කිරීමට වසර ගනනාවක් ගතවන අතර ඒවා අයිඒඊඒ හි නිරීක්ෂනය යටතේ පවතියි. නටාන්ට්ස් මධ්‍යස්ථානය සඳහා වූ 50,000ක [විනාඩියකට භ්‍රමන වාර ගනන 20,000-5,000,000 අයත්කර ගනුයේ අතිකේන්ද්‍රාපසාරකයක්] වායු කේන්ද්‍රාපසාරිකයන්ගෙන් පරීක්ෂාවට බඳුන් කර ඇත්තේ 164ක් පමනි. ජාතික බුද්ධි අංශයේ අධ්‍යක්ෂ ජෝන් නිග්‍රොපොන්ට් පවා පසු ගිය වසරේදී තක්සේරු කලේ ඉරානය බලාපොරොත්තුවන්නේ න්‍යෂ්ටික බෝම්බ නම් ඒ සඳහා තවත් දශකයක් වත් ගතවනු ඇති බවයි.

ඉරාන නායකයන් අවස්ථා ගනනාවක දී ම අඟවා ඇත්තේ, ආර්ථික ආධාර, තාක්ෂනික සහාය හා ආරක්ෂක සහතිකයක් ඇතුලු සවිස්තරාත්මක පොරොන්දු මාලාවක් වෙනුවෙන් තමන් යුරෝනියම් සුපෝෂන වැඩ කටයුතු මුලුමනින් ම අත් හිටුවීමට හෝ දැඩි ලෙස සීමා කිරීමට සූදානම් බවය. කෙසේ වුව ද 2003 දී බුෂ් පාලනාධිකාරය එවන් පොරොන්දුවක් දීම ද ටෙහෙරානය සමග සාකච්ඡා කිරීම ද ප්‍රතික්ෂේප කල අතර, අර්බුදය අවසන් කිරීම සඳහා දැරූ යුරෝපීය උත්සාහයට වල කැපී ය. එක්සත් ජනපදයේ ආරක්ෂක සහතිකයකින් තොර කිසිදු එකඟත්වයක් අර්ථ විරහිත විය. බුෂ් හා ඔහුගේ ඉහල නිලධාරීන් යලි යලිත් කියා සිටියේ ඉරානයට එරෙහි එක්සත් ජනපද මිලිටරි ප්‍රහාරයක් ද ඇතුලත්, සියලු විකල්පයන් මේසය මත ඇති බවයි.

බුෂ් පාලනාධිකාරයේ අරමුන, න්‍යෂ්ටික අර්බුදය සාකච්ඡා මාර්ගයෙන් අවසන් කිරීම නොව, එක්සත් ජනපද අවශ්‍යතාවයන් සඳහා සේවය කරන යටත් පාලන තන්ත්‍රයක් තෙහෙරානයෙහි ස්ථාපිත කිරීමේ "පාලන තන්ත්‍ර වෙනසකි" ඉරාකය සම්බන්ධ ප්‍රශ්නයේ දී මෙන්ම, කොන්ග්‍රසය එවන් විකල්පයක් අනුමත නොකරන තතු තුල බුෂ් පාලනාධිකාරය, මේ සඳහා යොමුවූ යාන්ත්‍රනයන් ගනනාවක් දැනටමත් පිහිටුවා තිබේ.

උප ජනාධිපතිගේ දියනිය වන එලිසබෙත් චේනිගේ ප්‍රධානත්වයෙන් ඉරාන කටයුතු පිලිබඳ කාර්යාලයක් රාජ්‍ය ලේකම් විසින් පිහිටුවා ඇති අතර එය ප්‍රතිපත්ති සම්බන්ධීකරනයෙහි නියැලෙමින් ඉරාන විරුද්ධ පක්ෂ කන්ඩායම්වලට "ප්‍රජාතන්ත්‍රවාදී ලැදි අරමුදල්", සපයයි. එම කටයුතු සඳහා අරමුදල මිලියන 10 සිට මිලියන 75 දක්වා වැඩිකර තිබේ. *බොස්ටන් ග්ලෝබ්* පුවත්පතෙහි ජනවාරියේ දී පලවූ ලිපියක ඉරාන සිරියා ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී කන්ඩායම් (අයිඑස්ඕජී) වැඩ කටයුතු මතු කර පෙන්වා තිබුනි. පෙන්ටගනයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ, සීඅයිඒ භාන්ඩාගාරයේ හා ජාතික ආරක්ෂක මන්ඩලයේ ඉහල නිලධාරීන් ගෙන් සැදුම් ලත් එම කන්ඩායම, ඉරානයට එරෙහි සන්ධානයන් ශක්තිමත් කිරීමට ත්, ඉරානයේ විරුද්ධවාදීන්ට මුදල් සපයමින් එරට ආර්ථිකව දුබල කිරීමටත් කටයුතු කරයි. අයිඑස්ජීඕව ගල්ෆ් පරාජයන් සමග මිලිටරි සන්ධානයක් ශක්තිමත් කිරීමෙහි යෙදී සිටියි. අවසාන වසයෙන්, *ලොස්ඇන්ජලීස් ටයිම්ස්* පත්‍රයට අනුව, ඉරාකයේ ජන සංහාරක අවි පිලිබඳව බේගල් ගෙතීමේ ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටුකල කුප්‍රකට විශේෂ සැලසුම් කාර්යාංශයට (ඕඑස්පී) සමාන ඉරාන අංශයක්ද පෙන්ටගනය විසින් ගොඩනගා තිබේ. ඉරානය පිලිබඳ අධ්‍යක්ෂ මන්ඩලයට හිටපු ඕඑස්පී නිලධාරීන් හා උපදේශකයන් ඇතුලත්ව සිටින අතර පැරනි ආකාරයට ම කටයුතු කරමින් සිටියි.

- ඉරාන පාලනයට එරෙහි අනෙක් චෝදනාව, එය ඉරාකය අස්ථාවර කරමින් එක්සත් ජනපද විරෝධී ත්‍රස්තවාදීන්ට උදව් කිරීමයි. මතු කල යුතු ප්‍රථම කාරනය නම් ඉරාකයේ සැබෑ අස්ථායීකාරකයා නම් එක්සත් ජනපදය වන බවයි. දෙවැන්න නම් ඉරාන බුද්ධි අංශ නිසැකවම ඉරාකය තුල ක්‍රියාකාරී වන වෙතත් ඒ ඔවුන් පමනක් ම නොවේ. නිදසුනක් ලෙස සෞදි අරාබිය එහි බුද්ධි අංශ පමනක් නොව වාර්තා ගනනාවකින් අඟවා ඇති ආකාරයට ඉරාකය තුල සුන්නි ත්‍රස්තවාදීන්ට මුදල් හා ආයුධ ද සම්පාදනයේ ද යෙදී සිටියි.

අනවරතයෙන් කෙරෙන ප්‍රකාශ තිබියදී ම එක්සත් ජනපදය ඉරාන පාලනය මගින් සිය විරුද්ධවාදී සටන්කරුවන්ට ක්‍රියාත්මකව ආධාර සපයන බවට සාක්ෂ්‍ය තවමත් ඉදිරිපත් කල යුතුව ඇත. *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* හි ජනවාරි 23 දින ලිපියකින් ප්‍රකාශ කලේ "සියලු ආක්‍රමනකාරී පුරසාරම් කෙසේ වෙතත්, එම ප්‍රකාශ සනාථ කිරීමට බුෂ් පාලනාධිකාරය ප්‍රමානවත් සාක්ෂ්‍ය ඉදිරිපත් කර නැත. එක්සත් ජනපද හමුදා කැටුව යන වාර්තාකරුවන් ඉරාන සම්බන්ධතාවන් පිලිබඳ පුලුල් සලකුනු දැක ඇත්තේ ද නැත. මෙහි එක්සත් ජනපද හමුදාවන් විසින් ඉරාක ත්‍රස්තවාදීන් බලකඳවුරක් වටලා පරීක්ෂා කිරීමේ දී ආයුධ තොග දුසිම් ගනනාවකින් සොයාගෙන ඇත්තේ එක් ඉරාන මැෂින් තුවක්කුවක් පමනි. එලෙසම ඉරාකයේ කටයුතුවලට ඉරානය පැටලී සිටින බවට

බ්‍රිතාන්‍ය නිලධාරින්දදොස් පැවරුවත් තමන් මුර සංචාරයේ යෙදෙන ප්‍රදේශවල දී ඉරානයේ නිෂ්පාදිත අවි සොයාගෙන නැති බව ද පවසති."

ඉරානය තුල එක්සත් ජනපද හා ඊස්රායල් ක්‍රියාන්විතයින් ගැන වඩාත් තොරතුරු හෙළිදරව් වී ඇත. ඊස්රායල හා එක්සත් ජනපද බුද්ධි අංශ, ඉරානය තුල අවශ්‍ය ඉලක්කයන් පිලිබඳව තොරතුරු රැස් කිරීමටත් හොර රහසේ ඇතුලුවන කුර්දි කන්ඩායම් පුහුනු කිරීමේ හා කුර්දි සුලුතරය අතර ආයුධ සන්නද්ධ විරෝධතාවන් දිරිමත් කිරීමේත් යෙදී සිටින බව, සෙමෝර් හර්ෂ් අවස්ථා ගනනාවකදී ම සඳහන් කර තිබේ. අසේරි, බලුකිස්ථාන් හා තවත් සුලුතර කොටස් අතර විරෝධතාවන් ඇවිස්සීමට ද ඒ හා සමාන උත්සාහයන් ගෙන තිබේ. *Target Iran* (ඉරානය ඉලක්ක කිරීම) යන සිය මෑත ම කෘතිය තුල ස්කොට්රිටර් ඉරානය තුල මෙහෙයුම් ගෙනයාමේ දී ඊස්රායල බුද්ධි අංශ මගින් දිගු කලක සිට කුර්දිවරුන් යොදාගැනීම පිලිබඳ විස්තර දක්වා ඇත.

*ලොස් ඇන්ජලීස් ටයිම්ස්* හි ජනවාරි 23 පලවූ ලිපියකට අනුව, දකුනු ඉරාකයේ බස්රා නගරයෙහි ඉරාන තානාපති නිලධාරිවරයා කියා සිටියේ ඉරාකයේ සිට ඉරානයට හොරෙන් ගෙන ආ වෙඩි උන්ඩ ආයුධ හා වෙනත් නීති විරෝධී උපකරන ඉරාන පොලීසිය මගින් සොයාගෙන ඇති බවයි. එය පර්සියානු පාලනයට එරහිව සන්නද්ධ ප්‍රහාරයන් සිදුවන කුඩා අරාබි සුලුතරයක් වාසය කරන විශේෂයෙන්ම කාලීන තෙලින් පොහොසත් කුසිස්ථාන් ප්‍රාන්තයේ දී සිදු විය.

- හෙස්බුල්ලා හා හමාස් යන "ත්‍රස්තවාදී" සංවිධානවලට ඉරානය ආධාර කරන බවට ද බුෂ් පරිපාලනය චෝදනා නගයි. ඒ, ලෙබනනය හා පලස්තීන ප්‍රදේශ තුල ඊස්රායලයේ සාපරාධී කටයුතු නොසලකාහරිමිනි. ඊස්රායලයේ ආධාර ඇතිව සමස්ත මැද පෙරදිගම හැඩගැස්වීමේ එක්සත් ජනපදයේ පුලුල් සැලසුම්වල කොටසක් ලෙස හෙස්බොබ්ලා හා හමාස් සංවිධානවලට දොස් පැවරේ. පසු ගිය ජුලි මාසයේ ලෙබනනයට එරෙහිව ඊස්රායලය ගෙන ගිය ම්ලේච්ඡ යුද්ධය සඳහා බුෂ් පාලනාධිකාරයේ දිරිමත් කිරීම් දක ගනු ලැබුවේ ඉරානයට හා සිරියාවට එරෙහි පුලුල් යුද්ධයක ආරම්භක අවස්ථාවක් ලෙස ය.

*හරෙට්ස්* හි ප්‍රධාන මිලිටරි වාර්තාකරු සියෙව් ස්කිෆ් *ෆොරීන් එෆෙයාර්ස්* සඟරාවේ නොවැම්බර්-දෙසැම්බර් කලාපයට ලියා ඇත්තේ "මෑතක දී ලෙබනනයේ සිදුවූ සටන්, දිගු කලක් පවතින අරාබි-ඊස්රායල් යුද්ධයේ තවත් එක් සටනක් ලෙසත්, පිලුනු වූ ප්‍රවෘත්ති ලෙසත් සැලකේ. එහෙත්, ඉන් ප්‍රකාශ කෙරෙන්නේ වඩාත් කනස්සලු සහගත තත්වයක් එනම්, ඊස්රායලය හා ඉරානය අතර නව යුද්ධයක ආරම්භයකි. හෙස්බුල්ලා සංවිධානය ඉරානයේ පෙරමුනු කොමාන්ඩෝ ඒකකය ලෙස සලකන ඊස්රායල් සංස්ථාපිතය නිසැකව ම මෙය සලකන්නේ එයාකාරයට ය."

ඉරාන පාලන තන්ත්‍රය, මෙම සියලු ප්‍රශ්න පිලිබඳ සවිස්තරාත්මක යෝජනා එක්සත් ජනපදය වෙත පිලිගන්වා ඇත. ඒ අතර තමන්ට සැලකිය යුතු තරම් ආකර්ශනීය පිලිගැන්වීමක් ලැබෙන්නේ නම් තමන් හෙස්බුල්ලා හා හමාස් වෙත සපයන ආධාර කපා හැරීමේ හැකියාව ද ඉඟිකර තිබේ.

බුෂ් බලාධිකාරයේ උද්ඝෝෂනයට ලැබුනු ලොකු ම තල්ලුව නම් 2005 දී මහමුඩ් අහමඩිනිජාඩ් ඉරානයේ ජනාධිපති ලෙස පත් වීමයි. ඔහුගේ උමතු ජාතිවාදී හා යුදෙව් විරෝධී ඇවිස්සීම්, ඉරානය හුදෙකලා කර මැද පෙරදිග වැඩ කරන ජනතාව අතර බෙදීම් ඇති කිරීමට නැඹුරු වී සිටින බුෂ් පරිපාලනයේ වාසියට ඍජුව ම හේතු වී තිබේ.

ඉරානයට එරෙහි එක්සත් ජනපදයේ යුදවාදී නැඹුරුවේ සැබෑ හේතුව ඉහත කරුනු කිසිවකට අදාල නොවේ. වොෂිංටනයේ සුපැහැදිලි අභිලාෂයවන්නේ ඉරානයේ දැවැන්ත තෙල් හා ගෑස් සංචිතවල පාලනය අත් කර ගැනීමයි. ඉරානය සැබෑ ලෝකයේ දෙවැනි විශාලතම ස්වාභාවික ගෑස් සංචිත ද තෙවැනි විශාලතම තෙල් සංචිත ද පවතියි. 2005 සංඛ්‍යා අනුව එය ලෝකයේ සිව්වැනි ප්‍රධානතම තෙල් නිෂ්පාදකයා ද, පස්වැනි විශාලතම අපනයනකරුවා ද වේ. එක් අතකින් එහි දැවැන්ත සංචිත ද අනෙක් අතින්, 1980 ගනන්වල ඉරාකය සමග පැවති දිග් ගැස්සුනු යුද්ධය නිසා බෙහෙවින් අඩාලව ඇති එහි යටිතල පහසුකම් ද මධ්‍යයේ; අපනයනයන් පුලුල් කිරීමේ සැලකිය යුතු අවකාශයක් පවතී.

**මතු සම්බන්ධයි**

© www.wsws.org